ලංසු සඳහා ආරාධනයයි

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

දික්ඕවිට උතුර ධීවර වරායේ බෝට්ටු අංගනයේ ඉතිරිව ඇති ප්‍රදේශයේ කාපට් ඇතිරීම

කොන්ත්‍රාත් අංකය: CFHC/PD/ASPBY/DK(N)/2026-91

1. "ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව" වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සභාපති විසින් ඉහත සඳහන් කාර්යය සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුදු, තැබූ ලංසු කැඳවනු ලැබේ. මෙම කාර්යයට බෝට්ටු අංගණයේ අස්ෆල්ට් එළීම (50mm Wearing Course සහ 50mm Binder Course ඇතුළත්ව), 150mm ඝනකම සහිත කොන්ක්‍රීට් මතුපිට ප්‍රදේශය සහ බෝට්ටු එසවීමේ ප්‍රදේශයේ L Angle සවිකිරීම ආදිය ඇතුළත් වේ. අවිනිශ්චිත වියදම් සහ වැට් (VAT) බදු රහිතව ඉංජිනේරු ඇස්තමේන්තුවේ ආසන්න වශයෙන් පිරිවැය මිලියන 49.9 කි. ස්ථානය: දික්ඕවිට උතුර අවිනිශ්චිත ධීවර වරාය (ගම්පහ දිස්ත්‍රික්කය)

2. ජාතික තරගකාරී ලංසු ක්‍රමය මගින් ලංසු කැඳවේ.

3. ලංසුකරු පහත සඳහන් යෝග්‍යතා නිර්ණායකයන්ට අනුකූල විය යුතුය.:

   - ලංසුකරු අසාධු ලේඛනගත අයෙකු නොවිය යුතුය.
   - ලංසු ඉදිරිපත් කරන අවස්ථාව වන විට මහාමාර්ග ඉදි කිරීම් ක්ෂේත්‍රයේ C5, C4හෝ C3 ශ්‍රේණියක් යටතේ CIDA හි ලියාපදිංචිව් තිබිය යුතුය.

4. ලංසුකරු පහත සඳහන් සුදුසුකම් නිර්ණායකයන්ට අනුකූල විය යුතුය:

   - පසුගිය වසර පහ තුළ (2019, 2020, 2023, 2024, 2025) ඉටුකරන ලද ඉදිකිරීම් කර්මාන්තයන්ගේ සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම අවම වශයෙන් ශ්‍රී ලංකා රුපියල් මිලියන 74 ක් විය යුතුය.
   - පසුගිය වසර 10 ඇතුළත ප්‍රධාන කොන්ත්‍රාත්කරු ලෙස මෙම කාර්යයට සමාන ස්වභාවයක් සහ සංකීර්ණත්වයක් ඇති කොන්ත්‍රාත්තු දෙකක (2) පළපුරුද්ද තිබිය යුතුය (මෙම අවශ්‍යතාවය සපිරීම සඳහා, සඳහන් කර ඇති කාර්යයන්ගෙන් අවම වශයෙන් 70% ක් වත් තිම කර තිබිය යුතුය). වටිනාකම ශ්‍රී ලංකා රුපියල් මිලියන 35.0 ක් (හෝ මහාමාර්ග හෝ ගොඩනැගිලි ඉදි කිරීම් ක්ෂේත්‍රයේ ඊට සමාන වටිනාකමක්) විය යුතුය
   - ව්‍යාපෘතිය අවසන් වන දිනය දක්වා, අනෙකුත් කොන්ත්‍රාත්තු වගකීම් සහ මෙම කොන්ත්‍රාත්තුව යටතේ ගෙවීමට සිදුවන ඕනෑම අත්තිකාරම් මුදලක් හැර තිබිය යුතු අවම ද්‍රවශීල වත්කම් සහ/හෝ ණය පහසුකම් ප්‍රමාණය ශ්‍රී ලංකා රුපියල් මිලියන 49.9 කට නොඅඩු විය යුතුය.
   - ටෙන්ඩර් කළ හැකි අගය රුපියල් මිලියන 5 ඉක්මවන සෑම ලංසුවක් සඳහාම, 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 8 වැනි වගන්තියට අනුකූලව පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද වලංගු සහතිකයක් ලංසුකරු සතුව තිබිය යුතුය. මෙය කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා සුදුසුකමකි.

5. මෙම ලංසුව සඳහා ඉදිකිරීම් කාලසීමාව දින දර්ශන දින 90 ක් වන අතර ගම්පහ දිස්ත්‍රික්කයේ දික්ඕවිට ධීවර වරායේ ව්‍යාපෘතිය පිහිටා ඇත.

6. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට, 011-2529391 යන දුරකථන අංකය ඔස්සේ "ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක් හවුස් පටුමග, කොළඹ 15" හි පිහිටි සිවිල් ඉංජිනේරු අංශයේ, සිවිල් ඉංජිනේරු කළමනාකරු වෙතින් වැඩිදුර තොරතුරු ලබාගත හැකි අතර, "ප්‍රසම්පාදන අංශය, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක් හවුස් පටුමග, කොළඹ 15" හි පිහිටි කාර්යාලයේදී ප්‍රසම්පාදන ලේඛන (නොමිලේ) පරීක්ෂා කර බැලිය හැක.

7. නැවත නොගෙවන ගාස්තුව රු. 3,500.00 ක් ගෙවීමෙන් අනතුරුව කොළඹ 15, රොක් හවුස් පටුමග, අංක 15, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, ප්‍රසම්පාදන කළමනාකරු වෙත ආයතනික ලිපි ශීර්ෂයක් යටතේ කරනු ලබන ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් 2026.09.08 සිට 2026.09.29 දක්වා ඕනෑම වැඩකරන දිනක පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා, උනන්දුවක් ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැක.

8. මුදු, තැබූ ලංසු අනු පිටපතක් සහිතව, 2026.09.30 දින පෙ.ව. 11.00 ට හෝ ඊට පෙර "සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ප්‍රසම්පාදන අංශය, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක් හවුස් පටුමග, කොළඹ 15" වෙත ගෙනැවිත් භාරදිය යුතුය. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු බාරගැනීම අවසන් වූ වහාම, සහභාගී වීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ. (ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් ලංසු විවෘත කරන අවස්ථාවට සහභාගී වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ).

9. ලංසු 2026.12.29දක්වා (දින 91ක්) වලංගු විය යුතුය.

10. සියලුම ලංසු සමඟ රුපියල් හත්ලක්ෂ හතළිස් පන්දහසක (රු. 745,000.00) වන 2027.01.26 දක්වා (දින 119 ක්) වලංගු ලංසු ඇපකරයක් (බැංකු ඇපකරයක් හෝ ආපසු ගෙවනු ලබන මුදල් තැන්පතුවක්) ඉදිරිපත් කළ යුතුය. ලංසු ඇපකරයක් "සභාපති, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, තැ.පෙට්ටිය 1747, රොක් හවුස් පටුමග, කොළඹ 15" නමින් ලබාගත් 9 වන කොටසේ සම්මත ආකෘති පත්‍රවල (ලංසු) ඇතුළත් ආකෘතියට අනුව තිබිය යුතුය. ලංසු ඇපකරය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවකින් ලබාගත යුතුය. මුදල් තැන්පතු ද පිළිගනු ලැබේ

11. පූර්ව ලංසු රැස්වීමක් 2026.09.18 දින පෙ.ව. 11.30ට ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15 රොක් හවුස් පටුමග, කොළඹ 15 හිදී පැවැත්වේ.

12. සියලුම ලංසුකරුවන් CIDA/SBD/01, දෙවන මුද්‍රණය, 2007 ජනවාරි (පෙර ICTAD/SBD/01) ලේඛනය සැලකිල්ලෙන් කියවන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,
අංක 15, රොක් හවුස් පටුමග, කොළඹ 15.